## 244 දිනපතා උදාවන

දිනපතා උදාවන හිරු කිරණින්
පෙති පිපී දිලෙන කුසුමන් විලසින්
යහ ගුණයෙන් පිබිදී සුවඳ දී
හැම සිත් සනසමු ළමා අපි

කැකුළු මලක ඇති අගය නොකිව හැක
තුවාල කළු ලප නොතිබේ නම්
පිපුණු මලෙන් වුව ඇතිවන පල කිම
ඒ මල හතිකට පරවේ නම්

කටු අතු අග වුව පිපි ලස්සන මල්
දකින දකින අය සිත් ගන්නේ
ජාතිය කුල මල සොයනු කුමට හොඳ
ගති ඇති ළමයින් බැබළෙන්නේ

ළමා සිරිත ගත සිත හා හොඳ නම
පව් කිළිටෙන් මැලවී යන්නේ
වරදෙහි නොබැඳී පිනට නැඹුරුවන
ළමයින් ලොවට උතුම් වන්නේ

දළදඬු බවකින් සිත දැඩි කරගෙන
නපුරු මගට පා නොතබන්නේ
පිරිසිදු හදකින් පින්බර හිතෙකින්
ඔබ හැම නිරතුරු සැරසෙන්නේ